din-454p-20x4-pnf WC-393-1

# ලංසු කැඳවීම

## අංක LPA/06/2020

# ලේක්හවුස් ආපනශාලාව

සේවකයින් 1500 කට පමණ ආහාරපාන සපයනු ලබන ලේක්හවුස් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පළපුරුදු ආපනශාලාකරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ආපනශාලාව භාවිත කරන සංඛ්‍යාව රඳා පවතින්නේ, ආපනශාලාකරුවන් විසින් සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය මතය.

ආපනශාලාව දිවා රාත්‍රී විවෘතව තැබෙන අතර, (පැය 24) තෝරාගනු ලබන ආපනශාලාකරු විසින් තත්ත්වයෙන් උසස් ගුණාත්මක බවින් යුත් ආහාරපාන නියම කරන ලද මිලට සැපයීම කළ යුතු වනු ඇත.

**මුළුතැන්ගෙයි උපකරණ, ආපනශාලාවේ ගෘහ භාණ්ඩ, විදුලිය, ජලය සහ මාසයකට (කි.ග්‍රෑ. 37.5) ගෑස් සිලින්ඩර් 20 ක් බැගින් නොමිලේ සපයනු ලබන අතර, කුලී අයකරනු නොලැබේ.**

ලංසු අයදුම්පත්‍ර සහ කොන්දේසි 2020 **සැප්තැම්බර්** 07 **සිට** 18 **දින තෙක්** සතියේ දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා** ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් රු. 5000/- ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් හා **රු.** 1000/- **ක** ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීම මත ලබාගැනීමට පුළුවන.

සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා, මුද්‍රා තබන ලද ලිපිකවරයක ඇතුළත් කර **"ආපනශාලාව සඳහා ලංසු කැඳවීම" යනුවෙන් ලිපි කවරයේ ඉහළ වම් කෙළවර සළකුණුකොට ප්‍රධානි - ප්‍රසම්පාදන, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම"**, යනුවෙන් යොමුකොට 2020 **සැතැම්බර්** 21 ප.ව. 2.30 ට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

2020 **සැප්තැම්බර්** 21 **දින** ප.ව. 2.30ට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

කෙසේ වෙතත් කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම ලංසුපතක් හෝ සියලුම ලංසුපත් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුය.

LAKE HOUSE

**ප්‍රධානි - ප්‍රසම්පාදන**
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**
**අංක. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**
**දුර.ක. 2429422, 2429451.**